පෙත්මග අභියස



කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රවේශ නියෝග ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයන වාර්තාව

(කුරුණෑගල, මල්ලවපිටිය, වාරියපොල, පොල්ගහවෙල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ ඇසුරින්)

ස්තුතිය

මෙය ආබාධ සහිත ප්‍රජාව ඇතුළු විවිධ දුෂ්කරතා අත්විඳිමින් ජීවිතේ යම් යම් අවධීන් පසුකරනු ලබන සමස්ථ මානව වර්ගයාගේ ප්‍රගමනය හා පහසුව උදෙසා දරනු ලබන ප්‍රයත්නයකි.ආසියානු පදනමේ දකුණු ආසියානු සුළු ප්‍රතිපාදන වැඩසටහන මෙම කාර්යයේදී මූල්‍ය අනුග්‍රහය ලබා දෙමින් අප වෙත දක්වනු ලබන සහාය අතිශයින්ම අගය කරමි.එසේම සමීක්ෂණය සඳහා සහභාගී වූ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලටත් එම කාර්යයට නොමදව හා අපව දිරිගන්වමින් සහාය ලබාදුන් සියළු ආයතන ප්‍රධානීන්ටත් මේ අවස්ථාවේ අපගේ ප්‍රශංසාව හිමිවිය යුතුය.

ආබාධ සහිත ප්‍රජාවගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය සඳහා කැපවීමෙන් හා ප්‍රශංසනීයව තාක්ෂණික සහාය ලබා දෙමින් කටයුතු කල ප්‍රියංගා කුමාරසිංහ ,සුරංජනී පුෂ්ප කුමාරි ගුණරත්න,ශනිල් අන්දරවැව, යන මහත්ම මහත්මීන්ටද ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය (ආකාස) පවුලේ ආදරණීය ප්‍රණාමය පුදකරමු.

මෙයට,

එම්.ආර්.චමින්ද කුමාර

(ව්‍යාපෘතිකළමණාකරු/ ව්‍යාපෘති උපදේශක)

සභාපතිතුමියගේ පණිවිඩය

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් අප සමාජය තුල නිතැතින්ම දක්නට ලැබුණු "ආබාධ සහිත භාවය "මිනිස් ජීවිත ඛේදනීය අයුරින් වෙනසකට භාජනය කල අතර ඒ නිසාම ඔවුන් වටා බරපතල මිත්‍යා ආකල්ප සමුදායක් නිර්මාණය විය නූතනයේ මිනිස් ජීවිත ඉතා සුව පහසුව ගෙවා දැමීමට අවශ්‍ය න්‍යායාත්මක මෙන්ම තාක්ෂණික දැනුමද ඉතා හොඳින් වැඩි දියුණුවී ඇති බව අප ඉතා ආඩම්බරයෙන් සිහිපත් කරමු.එහෙත් නූතන විද්‍යාත්මක දියුණුවේ ප්‍රතිපල සමස්ත සමාජයේම ප්‍රගමණයට හේතු විය යුතු වුවත් එය මෙතෙක් ප්‍රයෝගික සංකල්පයක් වී නැත.ඊට හේතු වූ කාරණා පිලිබඳ ප්‍රමාණවත් පුළුල් වූ සංවාදයක්ද සමාජය තුල ගොඩ නැගී නොමැති බව පෙනේ.

කෙසේ වෙතත් මෙකී විෂමතාව උදෙසා මානව සන්තානගත ප්‍රතිගාමී මිත්‍යාවන් හේතුවෙන් අදටද ආබාධ සහිත පුද්ගලයන් නොසැලකිල්ලට අවමානයට භාජනය වීම දැක ගත හැකිය මෙම අවමන් සහගත තත්වයන් තුලින් ඔවුන් මුදවා ගනිමින් කිසියම් සමාජ සංවර්ධන කාර්යයක යෙදවීම සඳහා ජාතික වැඩ පිළිවෙලක් අවශ්‍ය වන අතර එය හුදු සුබසාධනය පමණක් කරගත්තක් නොවිය යුතුය.

එහිලා ආබාධ සහිත පුද්ගලයන් පිලිබඳ ආබාධ සහිත භාවය පිලිබඳ නිසි විද්‍යාත්මක අධ්‍යනයන් පිලිබඳ අවධානය මීට වඩා යොමු කල යුතු බව පෙනේ.ඒ අනුව මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ අවස්ථා සහ පහසුකම් වැඩි දියුණු කල අතර ඊට යම් දායකත්වයක් ලබා දීම මෙම අධ්‍යන වාර්තාව විසින් සිදු කර ඇතැයි යන්න මාගේ අපේක්ෂාවයි.

ආබාධ සහිත භාවය කවර නරාතිරමක කවර සමාජ වටපිටාවක පුද්ගලයෙකු වුවද පීඩාවට මෙන්ම නොසැලකිල්ලටත් අවමානයටත් ලක් කරයි.මෙම තත්වය මානව දයාවෙන් පිරි අප වැනි ආසියාතික රටකදී වුවද නිරන්තරයෙන් දක්නට ලැබේ.ඒ අන් කිසිවක් නිසා නොව ආබාධ සහිත පුද්ගලයා වටා ගොනුවී ඇති අනේක විධි මිත්‍යා ආකල්ප බව මනාව පෙනෙන්නට තිබේ.අප ලාංකීය සංස්කෘතිය තුල වසර දහස් ගනනක් මුළුල්ලේ ආබාධ සහිත පුද්ගලයන් කරුමක්කාරයන් හෝ අවසනාවන්තයන් සේ සලකා ඔවුන්ගේ දායකත්වය ජාතික සංවර්ධනයට සහය කර ගැනීමේ උත්සහයක්වත් නොතිබුණි.ඔවුන් දිගින් දිගටම අනුන් මත යැපෙන පරාධීනයන් සේ සලකමින් කටයුතු කිරීමට මුළු මහනා සමාජයම පෙළඹ තිබුණි.

ඒ අනුව ආබාධ සහිත පුද්ගලයින්ගේ මානව අයිතීන් පිලිබඳ වැඩි උනන්දුවක් සමාජය තුල ඉස්මතු වීමක් දක්නට නොලැබුණි.මේ හේතු මත සමාජය තුල මෙන්ම පරිසරය තුලද අබාධ සහිත ප්‍රජාව පිළිගැනීමකට හෝ ගෞරවයකට

ලක්වී නොතිබුණි.එහෙත් රට සංවර්ධනයේදී සලකා බැලිය යුතු නවත් ජන කණ්ඩායමක් බව අප මෙහිලා සිහිපත් කරන්නේ ආබාධ සහිත වූවන් රටේ ජනගහනයෙන් 10%ක තරම් ඉහල අගයක් නියෝජනය කරන නිසාය.

තීරණ ගන්නන් ,සැලසුම්කරුවන්,මෙන්ම බොහෝ ආබාධ සහිත පුද්ගලයන්ද ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සමාන අවස්ථාවන් පිලිබඳ අවධානය යොමු නොකර ඇති බැවින් අබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් උල්ලංගණය වෙමින් සමාජය තුල කොන්වීමට ලක්ව ඇත.පරිසරය තුලට ප්‍රවේශ වීම සඳහා ඇති බාධක ඔවුන්ට ස්වාධීන ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය අහුරා ඇත.පරිසර බාධක ඇතුළු බාධා ඉවත් කර සාමාන්‍ය ප්‍රජාව සඳහා නිර්බාධ පරිසරයක් ගොඩ නැගීමට සැලසුම් කරන සැලසුම් කරුවෝ හා තීරණ ගන්නන් ආබාධ සහිත ප්‍රජාව නොසලකා හැර ඇත.එම නිසාම ආබාධ සහිත ප්‍රජාව දැඩි පීඩනයන්ට ලක්වේ.

ඉතා ඉහල සංවර්ධනයකට ලක්ව ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය ආයතන ,පෞද්ගලික ආයතන , බැංකු, වෙළඳ සැල්,මෙන්ම ආගමික ස්ථානද 60ක් මෙම සමීක්ෂණයට භාජනය කර ගත්තෙමු.එම ආයතන විමර්ශනාත්මක අධ්‍යනයකට ලක් කර එහි ඇති සැබෑ තත්වය මැන බැලීමට මෙමගින් අවස්ථාව ලැබුණි.

ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් පිලිබඳ කලයුත්තේ කුමක්ද යන්න අපහට සාකච්ඡා කර තීරණ ගැනීමට මෙම අධ්‍යනය ඉමහත් පිටුවහලක් වනු ඇත.

එසේම මෙම පර්යේෂණය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ ආසියා පදනමේ දකුණු ආසියානු කුඩා මූල්‍ය ප්‍රතිපාදන වැඩසටහනටද, මේ සඳහා නොමඳ සහයෝගය ලබා දුන් කුරුණෑගල දිස්තික් ලේකම් තුමා අතිරේක දිස්ත්‍රික් ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද, සියලුම ආයතන ප්‍රධානීන්ටද සහය දැක්වූ සියලුම රාජ්‍ය,පෞද්ගලික අංශයේ නිලධාරීන්ටද, මේ සඳහා කැපවීමෙන් උනන්දුවෙන් සියලුම සහය ලබා දුන් අප කාර්ය මණ්ඩලයේ ප්‍රියංගා කුමාරසිංහ, සුරන්ජනී පුෂ්ප කුමාරි ගුණරත්න, ශානිල් අන්දරවැව යන මහත්ම මහත්මීන්ට සහ සියලු කාර්ය මණ්ඩල නිලධාරීන්ට මෙන්ම විශේෂයෙන්ම මෙම පර්යේෂණය සැලසුම් කරමින්, නිලධාරීන් පුහුණු කරමින්,මෙන්ම දත්ත විශ්ලේෂණය කරමින් ද මෙම පර්යේෂණය වාර්තාවක් ලෙස පිලියල කල මෙම ව්‍යාපෘතියේ කළමනාකරු චමින්ද කුමාර ප්‍රේමතිලක මහතාටද මාගේ ස්තුතිය පිරිනමමි.

එන්. පී. කමලාවතී
ආබාධ සහිත කන්තාවන්ගේ සංගමය

පටුන

	පිටු අංකය
1. පෙත්මග අභියස	01 - 02
2. සැමට ප්‍රවේශය සහතික කිරීම තුල නිර්මාණය වන සාධනීය තත්වයන්	03 - 06
3. ආබාධ සහිත භාවය පිළිබඳ නෛතික විග්‍රහය	07 - 10
4. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ නෛතික රැකවරණය	10 - 12
5. විධික්‍රමය	12 - 13
6. නියැදියේ ස්වරූපය	14 - 16
7. සමීක්ෂණ ප්‍රතිඵල	17 - 25
8. අපේක්ෂිත මට්ටම	25 - 29
9. සමීක්ෂණ ප්‍රතිඵල	29 - 47
10.සාරාංශය	48
11.ආශ්‍රිත ග්‍රන්ථ	49
12.ඇමුණුම්	50 – 58

පෙත්මග අභියස !

සමාන හිමිකම් ඇති සමාජයකට ආබාධ සහිත ප්‍රජාවගේ ප්‍රවේශය යන ව්‍යාපෘතිය යටතේ ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ අයිතිවාසිකම් තහවුරු කිරීමේ අරමුණින් මෙම සමීක්ෂණය වාර් තා ව එළිදක්වනු ලබයි. .විවිධ අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගෙන සමාජය තුල හඬ අහිමි ජන කණ්ඩායමක්ව දිවි ගෙවන ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ හඬ අවදි කරමු. **පෙත්මග අභියස”** වැඩ සටහන කියා සිටිනුයේ ලොව් තුරු සුව ලබන්නට නොව දසත විහිදී ඇති සියගණනක් වූ මානව සේවාවන් තුලට තමාටද පිවිසෙන්නට ඉඩ හසර සලසමින්,පෙත්මග කඩොලු විවර කරන ලෙසයි.

ප්‍රවේශ නියෝග වලට අනුව ප්‍රවේශ වීම යනු; වෙනත් තැනැත්තෙකුගේ සහාය වීමක් නොමැතිව යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට හෝ පොදු සේවාවන් සහිත ස්ථානයකට ඇතුළු වීමට,ළඟා වීමට,ඔබ මොබ යාමට හා එහි ඇති පහසුකම් මෙන්ම සේවාවන් ප්‍රයෝජනයට ගැනීමට යම් තැනැත්තෙකුට ඇති හැකියාවයි”.

මෙහිදී භෞතික හා භෞතික නොවන ප්‍රවේශය කෙතෙක් දුරට සාධනය වී ඇතිද යන්න විමසා බැලෙන අතර ඒ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ , කුරුණෑගල ,මල්ලවපිටිය, වාරියපොල හා පොල්ගහවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පිහිටා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 60ක් මේ සඳහා සහභාගී කරගනු ලැබිණි.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථානුකූලව

පනවා ඇති නීති හා පනත් ප්‍රකාරව මෙම ප්‍රදේශ වල පවත්වාගෙන යන ආයතනික සේවාවට ආබාධ සහිත පුද්ගලයන් සඳහා කොතෙක් දුරට දොරටු විවෘත වී ඇතිද යන්න මෙහිදී විමසා බැලෙන අතර ඒ ආශ්‍රිතව පවතින ගැටළු නිරාකරණය කරමින් ආබාධ සහිත ප්‍රජාව ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක කරලීමට මෙමගින් අවස්ථාව උදාකරනු ඇත.

ප්‍රවේශ පහසුකම් අවශ්‍ය කරන්නේ කා සඳහාද?

සැබවින්ම මෙම ප්‍රවේශ පහසුකම් පිළිබඳ දැඩිව පීඩා විඳින කණ්ඩායමක් ලෙස ආබාධ සහිත ප්‍රජාව හඳුනාගනු ලැබුවද සමාජයේ විවිධ කොටස් මෙකී ප්‍රවේශ පහසුකම් නොමැතිවීම තුල අපහසුතාවන් තාවකාලිකව හෝ අත්විඳින බව දක්නට ලැබේ.ඒ අනුව එම අපහසුතා අත්විඳින කණ්ඩායම් කවුරුන්දයි හඳුනාගනිමු.

ප්‍රවේශ පහසුකම් අවශ්‍ය ජන කණ්ඩායම්

- ආබාධ සහිත පුද්ගලයන්
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්
- ගර්භණී කාන්තාවන්
- කුඩා දරුවන්
- තාවකාලිකව වලන ඌනතා වලට මුහුණදෙන පුද්ගලයන්
- හදවත් රෝගීන්
- සන්ධි සහ සන්ධි ආශ්‍රිත රෝග සහිත පුද්ගලයන්
- අධි තරබාරු පුද්ගලයන්

සැමට ප්‍රවේශය සහතික කිරීම තුල නිර්මාණය වන සාධනීය තත්වයන්

- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහ රාජ්‍ය තුල පවතින අනිකුත් පනත් ,නීති , රෙගුලාසි,අතිවිශේෂ ගැසට් පත්‍ර ,චක්‍රලේඛ, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග සහ ජාත්‍යන්තර සම්මුතීන් රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වීම තුලින් ශ්‍රී ලංකාව වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් බවට පත්වේ.
- රටේ ප්‍රධාන නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු අනෙකුත් නීති රෙගුලාසි සහ මානව හිමිකම් උල්ලංඝණය නොවන බව ජාතිය හා ජාත්‍යන්තරයට ඔප්පුවීම.
- සැමට අයිතීන් භුක්ති විඳීමට ඉඩ ප්‍රස්තාව ලැබීම.
- සේවා වියදම් අවම වීම.
- සමාජ සම්බන්ධතා ශක්තිමත් වීම.
- සමාජ අන්තර්කරණයට මූලික පදනම වැටීම
- විවිධත්වයට ගරුකිරීම සහිත සමාජයක් ගොඩනැගීම
- සියළු පුරවැසියන්ට ස්වාධීන ජීවිතයක් ගතකිරීමට හැකිවීම
- අවාසිදායක කොටස් ජන සමාජය තුල දක්නට නොලැබීම
- පුද්ගල ආත්ම අභිමානය ඉහළ යාම
- ජාතික සංවර්ධනයට සියළු දෙනා හවුල් කරුවන් වීම

- සමස්ථ ප්‍රජාවේ,රටේ/හැදියාව ශීලාචාර කම,මනුසත්බව සහ සහවේදනාත්මක ආකල්ප පෙන්නුම් කිරීම

මෙම සමීක්ෂණ වාර්තාවේ පෙන්වා දෙනු ලබන කරුණු කුරුණෑගල දිස්ත්‍රික් ඉදිරි සංවර්ධන උපාය නාර්ගික සැලසුම් සකස් කරලීම සඳහා භාවිතා කිරීම තුලින් ජාත්‍යන්තර සංවර්ධන ප්‍රමිතීන් අතරට මෙම දිස්ත්‍රික්කයද රැගෙන යාමට අවස්ථාව උදාවනු ඇත.

අධ්‍යනයේ අවශ්‍යතාව

1. 2006.10.17 අංක 1467/15 අතිවිශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2009 .09.18 අංක 1619/24 ප්‍රවේශ නියෝග අනුව ඉදිකර තිබෙන සියළුම ප්‍රසිද්ධ ගොඩනැගිලි,ප්‍රසිද්ධ ස්ථාන සහ පොදු සේවාවන් ලබාගත හැකි ස්ථාන මෙම නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් වසර 8ක් ඇතුලත එනම් 2014.10.16 වන දිනට පෙර මෙම නියෝග වලට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට ගොඩනංවනු ලැබිය යුතුය.එහෙත් එවැනි සාධනීය හා මානුශීය තත්වයක් දක්නට නොමැති වීම
2. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සවිබල ගැන්වීම සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ 2020 කාර්ය සාධන වාර්ථාව අනුව (පිටු අංක 27-3.2.5)

3.2.5 ප්‍රවේශ පහසුකම් හා තොරතුරු සන්නිවේදනයට ප්‍රවේශ වීමේ අවස්ථා

“අ. 2006 10 17 වන දින හා අංක 1467/15 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අදාල භෞතික ප්‍රවේශය පිළිබඳ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම රෙගුලාසි වල දක්වා ඇති සම්මතයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම,එවැනි රෙගුලාසි පිලිනොපදින රජයේ ගොඩනැගිලි හිමිකරුවන්ට එරෙහිව පැමිණිළි කිරීම හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතුය.නමුත් මෙම නීති රෙගුලාසි බලාත්මක කර ගැනීමට මෙන්ම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වී ඇත.ගොඩනැගිලි වලට පමණක් නොව බොහෝ මහාමාර්ග සහ පොදු ප්‍රවාහන පද්ධතිය තුලද ප්‍රවේශ වීමේ අවම ප්‍රමිතීන් ඇතිකර ක්‍රියාත්ම කිරීම මන්දගාමී ස්වරූපයෙන් සිදුවන බව නිරීක්ෂණය විය.

ආ. සංඥා භාෂණ පරිවර්ථනය සඳහා ජාතික සහතික පත් වැඩසටහනක් සකස් කිරීම සිදුකල යුතුය .ඒ අනුව අඩු ආදායම් ලබන සමෘද්ධි පවුල් වල අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති දරුවන් 50 දෙනෙකු තෝරාගෙන ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙතින් මාස 6 සංඥා භාෂණ පරිවර්ථකයන් ලෙස ඩිප්ලෝමා පාඨමාලාවක් සකස් කර පුහුණුවීම් ලබා දී තිබුණි.එහෙත් එම පුහුණුවෙන් පසුව සහතිකපත් ලබාදී තිබුන නමුත් පසුව රාජ්‍ය ආයතන වලට බඳවා ගැනීමට කටයුතු කර නොතිබිණි.2019 වර්ෂය වන විට රාජ්‍ය අංශයේ සංඥා භාෂණ පරිවර්ථකයන් ලෙස නිලධාරීන් හයදෙනකු පමණක් සිටින බව නිරීක්ෂණය විය.”

ඉහත කරුණු ගැඹුරින් විමසා බැලීමේදී අප රට තුල ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් පවතින තත්වය මනාව

නිරීක්ෂණය වන අතර තවදුරටත් මෙම අධ්‍යනයෙහි අවශ්‍යතාවය පෙන්වා දිය හැකිය.

3. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල, පොල්ගහවෙල, වාරියපොල, 13, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල නාගරික බල ප්‍රදේශ තුල ආබාධ සහිත ප්‍රජාවගේ ප්‍රවේශ පහසුකම් ලබාගැනීමේ නෛතික අයිතිය කෙතෙක් දුරට සඵල වී ඇත්දැයි විමසා බැලීම
4. ප්‍රවේශ විගණන වාර්තාව සඳහා අදාල සමීක්ෂණයට ලක්වූ ආයතන සහ ප්‍රදේශයේ බල අධිකාරීන් වෙත යොමු කොට ඔවුන්ගේ සේවාවන් තුලට හා සංවර්ධන උපාය මාර්ගික සැලසුම් වලට ආබාධ සහිත ප්‍රජාව අන්තර් ග්‍රහණය කිරීමට අවශ්‍ය සහාය ලබාදීම
5. ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආකාස ආයතනය විසින් ඉදිරියේදී ගනුලබන ක්‍රියාකාරකම් උදෙසා උපදේශන සංග්‍රහයක් සකස් කර ගැනීම
6. ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් කටයුතු කරන වෙනත් සමාජ ක්‍රියාකාරීන් හෝ ආයතන වෙත සිය කටයුතු පහසුකර ගැනීම උදෙසා තොරතුරු සපයා ගැනීමේ අපහසුතා මඟහැරවීම

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රවේශ විගණන වාර්තාව පිලියෙල වී ඇති බව මෙහිදී පෙන්වා දීමට පුළුවන.

ආබාධ සහිත භාවය පිලිබඳ නෛතික විග්‍රහය

ආබාධ සහිත භාවය පිළිබඳ හැඳින්වීම 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ පනතට අනුව **“ ආබාධ සහිත තැනැත්තෙකු යන්නෙන් සහජයෙන්ම ඇතිවූ හෝ එසේ නොවූ ,ශාරීරික හෝ මානසික හැකියාවන්හි,යම් ඌනතාවයක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතවයන් මුළුමනින්ම හෝකොටස් වශයෙන්, හෝ තමා විසින්ම තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තෙකු”** ආබාධ සහිත පුද්ගලයකු සේ සලකනු ලබයි.

සමාජ සේවා අමත්‍යාංශය පෙන්වා දෙන අන්දමට ආබාධ සහිත වූවන් වර්ගීකරණයේදී දෘශ්‍යාබාධ , කථන ආබාධ , ශ්‍රව්‍ය ආබාධ , චලන ආබාධ , බුද්ධිමය ආබාධ , මානසික ආබාධ , අපස්මාරය , යන ආබාධයන් හෝ මින් එකකට වැඩි ගණනක් ඇති පුද්ගලයන් බහු ආබාධ වශයෙන්ද පෙන්වා දී ඇත.කෙසේ වෙතත් අද වන විට “ආබාධිතතාවය”නිර්වචනය කිරීමේ හා ඒදෙස බලන ආකාරයේ විශාල නව වෙනසක් සිදුව තිබේ.ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (CRPD) නිර්වචන තුල ආබාධිතතාව ඇතුලත් නොකරයි.එය ආබාධිතතාව විකාශනය වන සංකල්පයක් ලෙස සලකයි. විවිධ බාධක සමඟ අන්තර් ක්‍රියා කිරීමෙන් සමාජයේ අන්‍යන් සමඟ සමාන පදනම්න් ඔවුන්ගේ පූර්ණ සඵලදායක සහභාගීත්වයට බාධා කල හැකි දිගුකාලීන ශාරීරික මානසික බුද්ධිමය හා සංවේදන හානි

ඇතුළුවන ලෙස ආබාධ සහිත පුද්ගලයන් විස්තර කරනු ලබයි.දැන් එය නිර්වචනය කරනු ලබන්නේ මනුෂ්‍යයන් ජීවත් වන පරිසරයට සාපේක්ෂව ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය අනුවය. සෞඛ්‍ය තත්ත්වය සලකා බැලීමේදී මනුෂ්‍යයකු සිය දෛනික ජීවිතය තුල කටයුතු කරන ආකාරයද අවධාරණය කෙරේ.

මනුෂ්‍යයකු ක්‍රියාත්මක වන ආකාරය ක්ෂේත්‍ර 3ක් මත රඳා පවතී.

පළමුවැනි ක්ෂේත්‍රය

මනුෂ්‍යයකුගේ ශරීරය ගොඩ නැඟී ඇති කොටස් හෝ ඉන්ද්‍රියන් (උදාහරණයක් ලෙස ඇස් ,කණ්, ස්වරාලය , පේශී, සන්ධි, ස්නායු, මොළය සහ මනස) අනුව ගැනේ.

දෙවැනි ක්ෂේත්‍රය

යම් පුද්ගලයෙකුගේ සිරුර එදිනෙදා කටයුතු කරන ආකාරය, පෙනීම, ඇසීම, කථනය, සන්නිවේදනය, යාම් රීම්, තමන්වම රැක බලා ගැනීම, ඉගෙනුම හා හැසිරීම යන ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

තුන්වැනි ක්ෂේත්‍රය

යම් තැනැත්තෙකු අන්‍යාන් සමඟ අන්තර් ක්‍රියාකරන ආකාරයයි. එනම් සමාජ භූමිකාව ඉටුකරන ආකාරයයි. උදාහරණයක් ලෙස වැඩ සහ රැකියාව, පාසල් යාම, ක්‍රීඩා, පවුලක කටයුතු, ප්‍රජාවේ හා සමාජයේ සාමාජිකයෙකු වීම ආදිය මෙහිදී ඇතුලත් වේ. සමාජ ආකල්ප ප්‍රවේශ විය නොහැකි ගොඩනැගිලි සහ පොදු අවකාශ වැනි පරිසරය තුල පවතින බාධක හේතුවෙන් යම් තැනැත්තෙකුට සමාජ භූමිකාව ඉටුකිරීම දුෂ්කර වී ආබාධ සහිත අයෙකු බවට පත්විය හැකිය.

මෙම ක්ෂේත්‍ර තුනම ඒවා ක්‍රියාත්මක විය යුතු නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ නම් යම් තැනැත්තෙකුගේ සෞඛ්‍යයෙහි සහ ක්‍රියාකාරීත්වයෙහි ගැටළුවක් ඇති නොවේ.

කෙසේ වෙතත් සෞඛ්‍යය තත්ත්වයක් හෝ රෝගයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් මෙම ක්ෂේත්‍ර අතුරින් කවර හෝ එකක් හෝ දෙකක් හෝ සියල්ලම ක්‍රියාත්මක වන ආකාරය වෙනස් වී ඇත්නම් එවිට එම තැනැත්තාට ආබාධිතතාවක් ඇති බව කියනු ලැබේ.එසේනම් ආබාධිතතාව යනු පුද්ගලයෙකුගේ සෞඛ්‍යය තත්ත්වය හා එම තැනැත්තාට ක්‍රියාකාරී වීම දුෂ්කර කරවන බාධක සම්බන්ධ වූ වෙනසක් සම්බන්ධයෙන් වන යෙදුමකි.ඕනෑම මනුෂ්‍යයෙකුගේ සෞඛ්‍යය තත්ත්වයෙහි වෙනසක් සිදුවිය හැකි බැවින් ඕනෑම මනුෂ්‍යයෙකුට ආබාධිතතාවයක් තිබිය හැකිය.එය අතීතයේ නිර්වචනය කරන ලද ආකාරයට පුද්ගලයෙකුට ආවේණික ලක්ෂණයක් නොවේ.

මේ ආකාරයට නිර්වචනය කරනු ලැබූ විට ආබාධිතතාවය යනු මනුෂ්‍යයකු වීමේ කොටසකි.එය මානව විවිධත්වයෙහි කොටසකි.එය අපගේ කොටසකි. ආබාධිතතාව මනුෂ්‍යයන් ලෙස අප වෙනස් තැනැත්තන් නොකරයි. මනුෂ්‍යයන් ලෙස අපට එකම හැඟීම් , ආවේග, අවශ්‍යතා හා අභිලාෂයන් ඇත.අපට එකම අයිතිවාසිකම් හා වගකීම් තිබෙන අතර අනෙකුත් සියළු දෙනාටම ලැබෙන අවස්ථා හා තේරීම් අපටද ලැබිය යුතුය.

ඒ අනුව ආබාධිතතාව යනු මනුෂ්‍යයකුගේ සෞඛ්‍ය තත්වයේ ඇතිවන වෙනස්කම් සමාජමය බාධක සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන් දෛනික ජීවිතය ගත කිරීමේදී ඇතිවන දුෂ්කරතා ලෙස හැඳින්විය හැකිය. ආබාධිතතාව දැකිය යුතු ආකාරය වන්නේ මනුෂ්‍ය ජීවිතයේ තත්වයක් සහ මාව න විවිධත්වයේ කොටසක් ලෙසය. ආබාධිතතා සහිත පුද්ගලයින්ට පාරිසරික බාධක හා ප්‍රතිවිරෝධී සමාජ ආකල්ප හේතුකොට ගෙන ඔවුන්ගේ දායකත්වය සමාජයට ලබාගැනීමට හා සහභාගී වීමට ඇති ප්‍රවේශය අහිමි කර ඇත. ආබාධ සහිත පුද්ගලයන්ට අනික් තැනැත්තන්ට හිමි අයිතිවාසිකම් වගකීම් අවස්ථා සහ තේරීම්ද හිමි විය යුතුව තිබේ .

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ නෛතික රැකවරණය

ප්‍රවේශ පහසුකම් පිළිබඳ සාකච්ඡාවේදී ආබාධ සහිත පුරවැසියන්ට සෙසු පුරවැසියන්ට සේම සමාන අවස්ථා හිමිවිය යුතුව ඇති බැවින් ශ්‍රී ලංකා ජනරජය මඟින් ස්ථාපනය කර ඇති නෛතික තත්ත්වයන් පහත ආකාරයට දැක්විය හැකිය.

i. 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සමාජ සේවා සහ සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලද ප්‍රවේශ නියෝගය (**2006 -10-17** අංක **1467/15** අතිවිශේෂ

ගැසට් නිවේදනය සංශෝධනය කරමින් නිකුත් කර ඇති **2009 -09-18** අංක **1619/24 ප්‍රවේශ නියෝග)**

ii. එසේම පොදු ගොඩනැගිලි වෙත පිවිසීම සම්බන්ධයෙන් 2009 -10-14 වැනි දින SC(FR) 221 /2009 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය

iii. ශ්‍රී ලංකා රජය අත්සන් කර අපරානුමත කර ඇති ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නවවෙනි වගන්තිය ප්‍රකාරව ප්‍රවේශයට ඇති අයිතිය

iv. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙතුන්වන පරිච්ඡේදයේ 12-2 වගන්තියේ සඳහන් **"කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය" යන සුවිශේෂී වගන්තිය** ඉහත වගන්තිය අනුව අප රටෙහි ප්‍රවේශ පහසුකම් සැලසීම නීත්‍යානුකූල එමෙන්ම අනිවාර්යයෙන් සිදුකල යුතු කාර්යයක් බව මනාව දක්නට ලැබේ.

කරුණු එසේ පැවතියද ආබාධිතතා ප්‍රතිපත්ති සංක්ෂිප්ත සටහන ඉදිරිපත් කරමින් ආචාර්ය පද්මිනී මෙන්ඩිස් සහ බිනේන්ද්‍රි පෙරේරා යන අයගේ ඉදිරිපත් කිරීම වන්නේ " අයිතිවාසිකම් මූලික කොටගත් ආබාධිතතාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් 2003 සිට ශ්‍රී ලංකාවට ඇත.ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුමත වූයේ 2016

දීය.මෙම එකඟතාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ආබාධිතතාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2014 දී අනුමත වූ අතර ජාතික මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලසුම් දෙකකට (2011-2015 සහ 2016-2020) ආබාධිතතාව ඇතුලත් කෙරිණි.ඒ එසේ වුවද ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් දිනාගැනීම හරහා ඔවුන් විසින් අත්විඳින අවාසි හා පීඩාවන් තුරන් කිරීමට සහ ඔවුන්ගේ ජීවන තත්වය නංවාලීමට රට තුල මේ දක්වා ගෙන ඇති අර්ථවත් පියවරක් නැත .

විධික්‍රමය

මෙම සමීක්ෂණය සඳහා භාවිතා කල විද්‍යාත්මක ක්‍රමවේදය පිළිබඳ පහත ආකාරයට විස්තර කල හැකිය.රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පොදුවේ භාවිතා කල හැකි ප්‍රශ්ණාවලියක් ගොඩනැගීම මුලින්ම සිදුකල අතර එහිදී 2006 ඔක්තෝබර් මස 17 වන දින නිකුත් කරන ලද 1467/15 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මූලික කර ගනිමින් විගණන සමීක්ෂණයට අදාල ප්‍රශ්ණාවලිය සකස් කරනු ලැබිණි.එහිදී ව්‍යූහගත රචනාමය ප්‍රශ්ණ ඉතා අවමයෙන් සහ කෙටි බහුවරණ ප්‍රශ්ණ පමණක් වැඩිපුර යොදාගන්නා ලදි.

දෙවන පියවර ලෙස සමීක්ෂණ කාර්ය මණ්ඩලයට දින දෙකක පුහුණුවක් ලබා දෙමින් ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව , ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව , මෙන්ම සමීක්ෂණ ක්‍රියාවලියකදී පවතින

විද්‍යාත්මක පසුබිම හා එවැනි ක්‍රියාවක නියැලෙන ආකාරය පිළිබඳවද අවබෝධයක් ලබාදෙන ලදි.

තෙවන පියවර ලෙස පූර්ව සමීක්ෂණයක් සඳහා ප්‍රශ්නාවලිය යොමුකර එහිදී මතුවූ සංශෝධනද සහිතව ක්ෂේත්‍ර සමීක්ෂණය ආරම්භ කෙරිණි.මෙහිදී අදාල ආයතන ප්‍රධානීන්ගේ සහයෝගය හා අනුමැතිය සහිතව එම සමීක්ෂණය සිදුකල අතරම ලබා ගත් දත්ත සඳහා අදාල ආයතන වල ප්‍රධානින්ගේ අනුමැතියද ලබාගන්නා ලදි.ඒ තුලින් මෙකී දත්ත වල නිවැරදිභාවය තහවුරු කර ගැනීමටද කටයුතු කර ඇත .මීට අමතරව ආයතනික ප්‍රවේශ පහසුකම් පිළිබඳ වත්මන් තත්ත්වය පිළිබඳ ඡායාරූප ගොනුවක්ද මෙම සමීක්ෂණයේ දත්ත සංචිතය සතුව පවතී.

මෙම සමීක්ෂණය මසක් තුල සිදුකරනු ලැබූ අතර සෑම සතියකටම වරක් රැස් කරන ලද තොරතුරු වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සියළු සමීක්ෂණ නිලධාරීන් සමඟ සියළු ප්‍රශ්න පත්‍ර නැවත පසු විපරමක් සඳහා භාජනය කල බව වැඩිදුරටත් සඳහන් කල හැකිය . ඒ ආකාරයට මෙම සමීක්ෂණය අඛණ්ඩ නියාමනයක් සහිතව හැකිතාක් නිවැරදි තොරතුරු රැස් කිරීමට උත්සුක වූයෙමු.

නියැදියේ ස්වරූපය

මෙම සමීක්ෂණය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල,මල්ලවපිටිය ,පොල්ගහවෙල හා වාරියපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරෙහි නාගරික පරිසරයෙහි පිහිටා ඇති රාජ්‍ය ආයතන හා රාජය නොවන ආයතන 60 ක් තෝරාගනු ලැබිණි.මෙහිදී බහුතර ජනතාවක් සේවාවන් ලබාගන්නා ආයතන වලට මූලිකත්වය දුන් අතර බොහොමයක් ආයතන කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඒවා වීම නොවැළැක්විය හැකි විය.එහෙත් එය සමීක්ෂණයේදී එහි ප්‍රතිඵලය කෙරෙහි අගතියක් සිදු නොවනු ඇත.ඊට හේතුව නම් කුරුණෑගල නගරය සෙසු ප්‍රදේශ වල ප්‍රධාන නගරය වීම හා බොහෝ ආයතන වල මූලස්ථානය කුරුණෑගල නගරබදව පිහිටා තිබීම දැක්විය හැකිය.

මෙම ආයතන තෝරා ගැනීමේදී ආබාධ සහිත ප්‍රජාව වඩාත් සමීප ආයතන ඇතුලත් කර ගැනීමට බොහෝ සෙයින් උත්සුක වූ අතර ආගමික ආයතන තෝරා ගැනීමෙදී බෞද්ධ, හින්දු ,කිතුණු, හා ඉස්ලාම් යන ආයතන වලින් ප්‍රධාන පූජනීය ස්ථාන තෝරා ගනු ලැබිණි.

සමස්ථයක් ලෙස ගත් කල භාණ්ඩ හා සේවා සපයන ආයතන රැසක්, පැතිරුණු ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් මෙම සමීක්ෂණ කාර්යය සිදු කිරීමට හැකියාව ලැබුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආබාධ සහිත පුරවැසියන් සඳහා සිය ආයතන තුල පවතින ප්‍රවේශ පහසුකම් පිලිබඳ විමසා බැලීමේදී ප්‍රධාන කරුණු 2ක් අවධානයට ගන්නා ලදි.

1.චලානාබාධ සහිත පුද්ගලයන් හා දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් සඳහා ආයතන තුල පවතින භෞතික ප්‍රවේශ පහසුකම්

2.දෘශ්‍යාබාධිත හා ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන් සඳහා ආයතන තුල පවතින සන්නිවේදන ප්‍රවේශ පහසුකම්

ඒ අනුව භෞතික හා සන්නිවේදන ප්‍රවේශයේ පවතින වත්මන් තත්වය කෙසේද යන්න පිළිබඳ තොරතුරු පහත දක්වා තිබේ.එහිදී,


- ප්‍රස්ථාර භාවිතාකර ඇති අතර එහි ප්‍රතිශතාත්මක අගය හා ඒකක අගයද නිරූපණය කර ඇත.
- 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුව ප්‍රවේශ පහසුකම් සම්බන්ධ අපේක්ෂිත මට්ටම සලකා බලමින් අදහස් ලබාදීම සඳහා සුදුසු ඡායාරූප මේ සමඟ ඉදිරිපත් කර ඇත.
- මෙම සමීක්ෂණයේ නිර්දේශ කවරේද යන්න ඉදිරිපත් කිරීමක් ලෙසද මෙම ඡායාරූප සලකනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම සමීක්ෂණය ආයතන 60 ක් සහභාගී කරගත් අතර ඒවායින් 40ක් රාජ්‍ය අංශයත් 20 ක් පෞද්ගලික අංශයත් නියෝජනය කරනු ලබයි.මෙකී නියෝජනය තුල මෙමෙ ආයතන භාණ්ඩ හා

සේවා සපයන ආයතන ලෙස වර්ග කල විට 86.7%ක් තරම් ඉහළ නියෝජනයකි සේවා සපයන ආයතන මෙයට සම්බන්ධ වී ඇත. භාණ්ඩ සපයන ආයතන ප්‍රමාණය 13.3%කි.


මෙකී තත්වය තුල ආබාධ සහිත ප්‍රජාව කෙතෙක් දුරට සිය අවශ්‍යතා සපුර ගන්නේද යන්න මෙම සමීක්ෂණ වාර්ථාව අනාවරණය කරයි.

සමීක්ෂණ ප්‍රතිඵල




ආබාධ සහිත පුද්ගලයන් සඳහා වාහන නවතා තැබීම වෙනුවෙන් ඔබ ආයතනයේ සුදුසු ස්ථානයක් වෙන් කර තිබේද යන්න විමසීමේදී ආයතන 13 ක් "ඔව්" යන පිළිතුර ලබාදී තිබේ.එය ධනාත්මක තත්වයක් ලෙස සලකනු ලබන අතර එම ආයතනයන් අදාල වාහන අංගන තුල ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් ස්ථානයක් වෙන් කර ඇති බව පිළිගත් සංකේත මඟින් තහවුරු කර නොමැති බව පෙනේ.නමුත් නාමකරණය කිරීම තුලින් ආබාධ සහිත පුරවැසියන්ගේ අයිතීන් තහවුරු කිරීමක් නිරූපණය කෙරෙන අතරම ඔවුන්ට එම ආයතන සහනදායී පරිසරයක්ද ලබාදෙනු ඇත.

04.ආබාධ සහිත පුද්ගලයන් සඳහා සිය වාහනය නවතා තැබීමට ඔබගේ රථගාලේ ඉඩක් වෙන්කර තිබේද?
60 responses



4:1වෙන්කර ඇත්නම් පිළිගත් සංකේත යොදා තිබේද?

60 responses



ආදර්ශන




ආදර්ශන









05:ප්‍ර.පා,සිට. සේවා ආයතනයේ ප්‍ර.දොරට ඇති මාර්ගය පඩිපෙල්
60 responses




05.2 ප්‍ර.පා,සිට. සේවා ආයතනයේ ප්‍ර.දොරට ඇති මාර්ගය කාණු,වලවල්
60 responses




ප්‍රධාන පාරේ සිට සේවා ආයතනයේ ප්‍රධාන දොරටුවට ඇති මාර්ගය සංචරණ උපකරණ භාවිතා කරන පුද්ගලයෙකුට ප්‍රවේශ වීම පිළිබඳව පවතින ගැටළුවෙහි තත්වය 5.0-5.1-5.2-5.3 දක්වා ප්‍රස්ථාර නිරීක්ෂණය කිරීමෙන් වටහා ගත හැකිය.




8. ප්‍රස්ථාර අංක 5.4 සිට 5.8 දක්වා රූප සටහන් නිරීක්ෂණය කිරීමෙන් ආයතනික ප්‍රවේශයේ බරපතල ගැටළුඇති බව නිරීක්ෂණය විය.






05.6 ප්‍රධාන දොරටුවේ බැවුමේ උස

60 responses




05.7 ප්‍රධාන දොරටුවට පිවිසෙන ස්ථානය ගැටීනි

60 responses





05.8 ප්‍රධාන දොරටුව පටුයි

60 responses




ආදර්ශන






ආදර්ශන


36" min. (between leading edge of handrails)
Handrails
on both sides if rise greater than 6"
Running Slope
1:12 max
Cross Slope
1:48 max
Rise
30" max per run
Surfaces
firm, stable, and slip-resistant (run and landing surfaces)
Level Landings
at top and bottom
Edge Protection
along ramp run and landings
Wet Conditions
Landings must be designed to prevent the accumulation of water.



ආදර්ශන






ආදර්ශන




06 ප්‍රධාන ප්‍රවේශයේ ආනති මාර්ග ඉදිකර

60 responses





06.1 ආනති මාර්ගයේ අත්වැට ඉදිකර

60 responses




ආයතන කීපයක ආනති මාර්ග හෙවත් රැම්ප් ඉදිකර ඇති බවක් නිරීක්ෂණය විය.එම ඉදිකිරීම් බොහොමයක් නීතිමය හෝ ප්‍රවේශ පිළිවිතරයණට අනුකූලව ඉදිකර නොමැති බව මෙම සමීක්ෂණයෙන් අනාවරණය විය.





07.2 සේවා කවුලු සඳහා යා හැකි පරිදි ස්පර්ශක මාර්ග ඉදිකර


60 responses



ආදර්ශන




ආදර්ශන





ආදර්ශන







ආදර්ශන



ආයතනික සේවා හා ඊට අවශ්‍ය ලිපි ලේඛන දෘශ්‍යාධිත පුද්ගලයන් සඳහා ඉදිරිපත් කර තිබේද යන්න සොයා බැලීමේදී කුරුණෑගල මහින්ද විද්‍යාලයේ ඇති විශේෂ ඒකකයේ පමණක් එකී පහසුකම දැකගත හැකිවිය.





ආදර්ශන






මෙම සමීක්ෂණයේදී ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන් සඳහා ආයතනික සේවාවන් සැපයීමට සංඥා භාෂාව හැසිරවිය හැකි නිලධාරියෙකු සිටීද යන්න සොයා බලන ලදි.එහිදී එවැනි ආයතන 2ක් හඳුනා ගැනිණි.






THANK YOU







සහන සේවා කවුළුවක් වැනි ආබාධ සහිත පුද්ගලයන් උදෙසා යම් වැඩසටහනක් අදාල ආයතන සතුව පවතීද යන්න ආයතන 37 ක් එවැනි ක්‍රමවේදයක් පවතින බව ප්‍රකාශ කර සිටී.එහෙත් අපගේ නිරීක්ෂණයන්ට අනුව ඔවුන් කියා සිටින්නේ යම් ආබාධ සහිත පුරවැසියෙකු සිය සේවා ස්ථානයට පැමිණි පසු ඔහු වෙත එකී විමසීමේදී ආයතනයේ නිලධාරියෙකු පැමිණ අවශ්‍ය කටයුතු විමසා බල ඉටුකරදීමේ ක්‍රියා පිළිවෙතක් පවතින බවයි.මෙමෙ තත්වය යහපත් ලෙස දැකිය යුතු නමුත් අප මෙහි ලා අවධාරණය කරනු ලබන්නේ ආබාධ සහිත පුද්ගලයෙකුටද වෙනත් පුරවැසියෙකුට සේම සිය අවශ්‍යතා ඍජුවම අදාල නිලධාරීන් හා සම්බන්ධව සාකච්ඡා කිරීමට, දැනුම් දීමට අවස්ථාව සැලසීම පිළිබඳවයි.ඒ අනුව එකී ආයතනික වැඩසටහන තවදුරටත් ශක්තිමත් කල යුතු අතර ප්‍රවේශ පහසුකම් ගොඩනැගීමෙන් එවැනි අතිරේක නිලධාරීන්ගේ සහාය වෙන්කිරීමේ අවශ්‍යතාව අහෝසි කරගත හැකිවනු ඇත.




11. ආයතනික පෙරටු කාර්යාලීය නිලධාරීන් බාධා සහිත පුද්ගලයන්ට සේවා සැපයීම පිලිබඳ පුහුණුවක් ලබා
60 responses



12 ආයතනය ඇතුලත ඇති ගල්(ටයිල්ස්) ලිස්සන සුලුය
60 responses




13 ආයතනය ඇතුලත සංචරණ ආධාරක භාවිතා කරන පුද්ගලයන්ට බාධකවලින් තොරව ඔබමොබ යාහැකිද?
60 responses




ආබාධ සහිත පුරවැසියන් සඳහා භාවිතා කිරීමට හැකි පරිදි ඉදිකර ඇති වැසිකිළි පද්ධති අදාල උපාංග සහිතව පවතින බව අනාවරණය විය.

14 ආබාධ සහිත පුරවැසියන් සඳහා වෙන්කරන ලද වැසිකිලියක් තිබේද?
60 responses




14.1 වෙන් කරන ලද වැසිකිලිය තුල පිලිගත් සංකේත ප්‍රදර්ශනය කර තිබෙද?
60 responses




ආදර්ශන




14.3 වෙන් කරන ලද වැසිකිලිය තුලට දෘශ්‍යාබාධිත අයට සුදුසු ප්‍රවේශ පහසුකම්
60 responses



ආදර්ශන




ආදර්ශන




14.4 ආබාධ සහිත පුද්ගලයාට සුදුසු පරිදි උපාංග සවිකර

60 responses



14.5ගැලපෙන උසකින් යුතු වැසිකිලි බදුනක් සවි කර

60 responses



ආදර්ශන



ආදර්ශන



සාරාංශය

- ආබාධ සහිත පුද්ගලයන් සඳහා භෞතික ප්‍රවේශ පහසුකම් ගොඩනැගීමේ තත්වය ආරම්භක මට්ටමක පවතින අතර ආයතන කීපයක ප්‍රමිතිගත තත්වයේ ප්‍රවේශ පහසුකම් දැකගත හැකිය.
- දැනට පවතින සමහර ප්‍රවේශ මාර්ග වල නිවැරදි තාවය පිළිබඳ ගැටළු පවතී.
- දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා වන ප්‍රවේශ පහසුකම් දුම්‍රිය ස්ථානයේ වේදිකාවේ පමණක් දැකගත හැකිය.

- දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ සන්නිවේදන පහසුකම් ලෙස දැකිය හැකි එකම ස්ථානය වූයේ ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපනය දෙනු ලබන විශේෂ ඒකකයක් සහිත පාසලක පමණි.
- ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයන්ගේ සන්නිවේදන ප්‍රවේශය පිළිබඳ විමසීමේදී ආයතන දෙකක නිලධාරීන් දෙදෙනෙකු සංඥා භාෂාව පිළිබඳ පුහුණුවක් ලබාගෙන ඇති බව අනාවරණය විය.
- මෙම සමීක්ෂණයේ සමස්ථ ප්‍රතිඵලය සැලකිල්ලට ගැනීමේදී කුරුණෑගල දිස්ත්‍රික්ක්කයේ ආබාධ සහිත ප්‍රජාව සඳහා භෞතික හා භෞතික නොවන ප්‍රවේශ පහසුකම් ඉතා අවම මට්ටමක පවතින බව හඳුනා ගැනුණි.

ආශ්‍රිත ග්‍රන්ථ

- ආබාධිතතා ප්‍රතිපත්ති සංක්ෂිප්ත සටහන - පද්මිණී මෙන්ඩිස් සහ බිනේන්ද්‍රි පෙරේරා
- ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබල ගැංවීම සඳහා ජාතික මහ ලේකම් කාර්යාලයේ කායී සාධනය -2020
- ජන හා නිවාස සංගණනය -2012.04.20 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ඇමුණුම් අංක 1 ප්‍රශ්නාවලිය

මෙහෙයවීම :ආකාස

අනුග්‍රහය:ආසියා පදනම

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය

විල්තෙර උයන,පලමු පටුමග,කුරුණෑගල.

දුරකතන අංකය-0773121062

ඊ-මේල් akasa.sl@gmail.com

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල පවතින ප්‍රවේශ පහසුකම් පිලිබඳ

විගණන සමීක්ෂණය

ආයතනය

a. නම:.....

b. ලිපිනය:.....

c. සේවා ආයතනයේ ස්වභාවය:-භාණ්ඩ සපයන ආයතනයකි. ☐

සේවා සපයන ආයතනයකි. ☐

වෙනත් ☐

d. පිලිතුරු ලබාදෙන අයගේ තනතුර සහ

නම:.....

1.0 ආබාධ සහිත පුද්ගලයන් සඳහා සිය වාහනය නවතා තැබීමට ඔබගේ රථ ගාලේ ස්ථානයක් වෙන් කර තිබේ.

- ඇත ☐
- නැත ☐

1.1 වෙන් කර ඇත්නම් පිලිගත් සංකේත යොදා තිබේ.

- ඇත ☐
- නැත ☐

2.0 ප්‍රධාන පාරේ සිට සේවා ආයතනයේ ප්‍රධාන දොරටුව දක්වා ඇති මාර්ගය

- පඩිපෙල් සහිතයි. ☐
- බොරලු මතුපිටක් සහිත අසම භූමියකි. ☐
- කාණු වළගොඩැලි සහිතයි. ☐
- සංචරණ උපකරණ භාවිතා කරන පුද්ගලයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි ගොඩනංවා
  ඇත. ☐ නැත. ☐
- ප්‍රධාන දොරටුව පඩිපෙලවල් සහිතයි. ඔව් ☐ නැත ☐
  පඩි ගණන ☐
- ප්‍රධාන දොරටුව තීව්‍ර බෑවුමක් සහිතයි. ඔව් ☐ නැත ☐
- ප්‍රධාන දොරටුව දිග සහ බෑවුමේ උස කීයද? අඩි ☐

- ප්‍රධාන දොරටුවට පිවිසෙන ස්ථානය ගැටිති සහිතයි.

  ඔව් ☐ නැත ☐

- ප්‍රධාන දොරටුව පටුයි. ඔව් ☐ නැත ☐

3.0 ප්‍රධාන ප්‍රවේශයේ ආනති මාර්ග ඉදිකර තිබේ.

- ඇත ☐
- නැත ☐

3.1 ආනති මාර්ගයේ අත්වැට ඉදිකර තිබේ.

- ඇත ☐
- නැත ☐

3.2 ආනති මාර්ගයේ පළල හා බෑවුම් ප්‍රමාණය

- නිවැරදි ☐
- වැරදි ☐

3.3 දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන්ට භාවිතයට සුදුසු පරිදි ස්පර්ශක ප්‍රවේශ ඉදිකර තිබේ.

- ඇත ☐
- නැත ☐

4.0 සේවා කවුලු සඳහා රෝද පුටුවෙන් යා හැකි මාර්ග සැකසී ඇත .

- ඇත ☐
- නැත ☐

4.1 රෝද පුටු භාවිතා කරන්නන් සඳහා ගැලපෙන උසකින් සේවා කවුලු එකක් හෝ ඉදිකර තිබේ.

- ඇත ☐
- නැත ☐

4.2 සේවා කවුලු සඳහා යා හැකි පරිදි ස්පර්ශක මාර්ග ඉදිකර තිබේ.

- ඇත ☐
- නැත ☐

5.0 ආයතනික සේවාවන් හා ඊට අවශ්‍ය ලිපි ලේඛන දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා ඉදිරිපත් කර තිබේ.

- ඇත ☐
- නැත ☐

6.0 දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් සඳහා ආයතනික සේවා සැපයීමට සංඥ භාෂාව හැසිරවිය හැකි නිලධාරියෙකු සිටී. ☐

නොසිටී. ☐

7.0 ඔබ ආයතනයේ සහන සේවා කවුලුවෙන් හෝ එවැනි ආබාධ සහිත පුද්ගලයන් සඳහා සේවා සැපයීම ක්‍රියාත්මක ක්‍රමවේදයක් පවතී.

- ඇත ☐
- නැත ☐

7.1 ආයතනික පෙරටු කාර්යාලීය නිලධාරීන් ආබාධ සහිත පුද්ගලයන්ට සේවා සැපයීම පිලිබඳ පුහුණුවක් ලබා තිබේ.

- ඔව් ☐
- නැත ☐

7.2 ආයතනය ඇතුලත ස්වරූපය,

7.2.1 ඇතුලත ඇති බිම අතුරා ඇති ගල් (ටයිල්ස්) පහසුවෙන්

ලිස්සන සුලුය. ☐

ලිස්සන සුලු නැත. ☐

7.2.2 ආයතනය ඇතුලත සංචරණ ආධාරක භාවිතා කරන පුද්ගලයන්ට බාධකවලින් තොරව

- ඔබමොබ යාමට හැකිය. ☐
- නොහැකිය. ☐

8.0 ආබාධ සහිත පුරවැසියන් සඳහා වෙන් කරන ලද වැසිකිලියක් තිබේ.

- ඇත ☐
- නැත ☐

8.1 ආබාධ සහිත පුරවැසියන් සඳහා වැසිකිලියක් වෙන් කර ඇත්නම් ඒ තුල ලොව පිලිගත් ආබාධ සහිත පුද්ගලයන් පිලිබඳ සංකේත ප්‍රදර්ශනය කර තිබේද?

- ඔව් ☐
- නැත ☐

8.2 රෝද පුටු භාවිතා කරන්නන් සඳහා සුදුසු ප්‍රවේශ පහසුකම්

- ඇත ☐
- නැත ☐

8.3 දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට සුදුසු පරිදි ප්‍රවේශ පහසුකම් තිබේද?

- ඇත ☐
- නැත ☐

8.4 ආබාධ සහිත පුද්ගලයාට සුදුසු පරිදි දොරගුලු ,ආධාරක,අත්වැටවල් ,විදුලි ස්විච් නිවැරදි උසින් යුත් සේදුම් බේසම් ආදී උපාංග සවි කර තිබේ.

- ඇත ☐
- නැත ☐

8.5 ගැලපෙන උසින් යුතු වැසිකිලි බදුනක් (කොමෝඩ්)සවිකර ඇත.

- ඔව් ☐
- නැත ☐

මෙහි ඇති තොරතුරු පිළිබඳ ආයතන ප්‍රධානියාගේ සටහන

.....

.....

නිරීක්ෂක සටහන

.....

.....

ඇමුණුම් අංක 2

සමීක්ෂණය සඳහා සහභාගී කරගත් ආයතන

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	-	කුරුණෑගල
2. ප්‍රධාන තැපැල් කාර්යාලය	-	කුරුණෑගල
3. දුම්රිය ස්ථානය	-	කුරුණෑගල
4. පළාත් සභා සංකීර්ණය	-	කුරුණෑගල
5. ආයුර්වේද රෝහල	-	කුරුණෑගල
6. ශික්ෂණ රෝහල	-	කුරුණෑගල
7. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	-	කුරුණෑගල
8. කාර්මික විද්‍යාලය	-	කුරුණෑගල
9. ප්‍රාදේශීය සභාව	-	මල්පිටිය, බෝයගනේ
10.ලංකාබැංකුව අධිශේණි ශාඛාව	-	මිහිඳු මාවත, කුරුණෑගල
11.මහජන බැංකුව අධිශේණි ශාඛාව	-	දඹුල්ල පාර, කුරුණෑගල
12.පොලිස් ස්ථානය	-	කුරුණෑගල
13.මහ නගර සභාව	-	කුරුණෑගල
14.උපරිමාධිකරණය	-	කුරුණෑගල
15.සර්.ජෝන් කොතලාවල විද්‍යාලය	-	කුරුණෑගල
16.ජාතික තරුණ සේවා සභාව	-	කුරුණෑගල
17.කර්මාන්ත සේවා කාර්යාංශය	-	කුරුණෑගල

18.ශාන්ත ආනා දේවස්ථානය	-	කුරුණෑගල
19.ජනකලා කේන්ද්‍රය	-	කුරුණෑගල
20.මොබිටෙල් ආයතනය	-	කුරුණෑගල
21.සතොස	-	රජපිහිල්ල පාර, කුරුණෑගල
22.ඩයලොග් ආයතනය	-	කුරුණෑගල
23.මිරැකල් හෙල්ත් රෝහල	-	කුරුණෑගල
24.සමුද්‍රා පොත් හල	-	කුරුණෑගල
25.ශ්‍රියානි ඩ්‍රෙස් පොයින්ට්	-	කුරුණෑගල
26.කාගිල්ඩ් ෆුඩ් සිටි	-	කුරුණෑගල
27.කැන්ඩියන් රීච් හෝටලය	-	කුරුණෑගල
28.ඇත්කඳ විහාරය	-	කුරුණෑගල
29.සොෆ්ට්ලොජික්	-	කුරුණෑගල
30.කතරගම දේවාලය	-	කුරුණෑගල
31.මස්ජිදය	-	මහවිදිය , කුරුණෑගල
32.ත්‍රී රෙස්ටුරන්ට්	-	කුරුණෑගල
33.ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්	-	කුරුණෑගල
34.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	-	මල්ලවපිටිය
35.උපතැපැල් කාර්යාලය	-	මල්ලවපිටිය
36.ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලය	-	මල්ලවපිටිය
37.සාමෝදය විද්‍යාලය	-	මල්ලවපිටිය
38.මහින්ද විද්‍යාලය	-	දඹුල්ල පාර, කුරුණෑගල

39.මහේස්ත්‍රාත් අධිකරණය	-	පිලැස්ස
40.ක්‍රෝල් හෝටලය	-	දඹුල්ල පාර, කුරුණෑගල
41.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	-	පොල්ගහවෙල
42.ශාන්ත බර්නදෙත් විද්‍යාලය	-	පොල්ගහවෙල
43.ප්‍රධාන තැපැල් කාර්යාලය	-	පොල්ගහවෙල
44.පොලිස් ස්ථානය	-	පොල්ගහවෙල
45.දුම්රිය ස්ථානය	-	පොල්ගහවෙල
46.ප්‍රාදේශීය සභාව	-	පොල්ගහවෙල
47.මහරෝහල	-	පොල්ගහවෙල
48.මහේස්ත්‍රාත් අධිකරණය	-	පොල්ගහවෙල
49.ලංකාබැංකුව	-	පොල්ගහවෙල
50.සම්පත් බැංකුව	-	පොල්ගහවෙල
51.මහමෙවුනාව	-	පොල්ගහවෙල
52.ඇන්දaa දේවස්ථානය	-	පොල්ගහවෙල
53.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	-	වාරියපොල
54.ප්‍රධාන තැපැල් කාර්යාලය	-	වාරියපොල
55.ප්‍රාදේශීය සභාව	-	වාරියපොල
56.ලංකා බැංකුව	-	වාරියපොල
57.පොලිස් ස්ථානය	-	වාරියපොල
58.සුමංගල විද්‍යාලය	-	වාරියපොල
59.කාගිල්ඩ් ෆුඩ් සිටි	-	වාරියපොල
60.සම්පත් බැංකුව	-	වාරියපොල

ප්‍රධාන කාර්යාලය
ආබාධසහිත කාන්තාවන්ගේ සංගමය (ආකාස)
පහලගම පාර,
තලාව.
දුරකථනය 0773121062 / 0716499521
ඊ-මේල් akasa.sl@gmail.com

ආකාස
පළමු පටුමග
විල්තෙර උයන,
කුරුණෑගල.
දුරකථනය 0773121062 / 0716499521 / 0372233093
ඊ-මේල් akasa.sl@gmail.com

ඉදිරිපත් කිරීම

අනුග්‍රහය

The Asia Foundation